# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.08.31 |


## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2023 අගෝස්තු මාසයේ දී තවදුරටත් පහළ ගියේය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 ජූලි මාසයේ වාර්තා වූ සියයට 6.3හි සිට 2023 අගෝස්තු මාසයේ දී සියයට 4.0 දක්වා පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, 2023 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද පුරෝකථනයන්ට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය<br>කො.පා.මි.ද., (2021=100) | 2023 ජූලි | 2023 අගෝස්තු |
|---|---|---|
| දර්ශක අගය | 190.2 | 190.1 |
| මාසික වෙනස (%) | -1.1 | -0.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 6.3 | 4.0 |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.

අඛණ්ඩව දෙවන මාසයටත් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර අවධමනයක් වාර්තා වූ අතර, එය 2023 ජූලි මාසයේ පැවති සියයට 1.4ට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේ දී සියයට 4.8ක් විය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආහාර නොවන උද්ධමනය 2023 ජූලි මාසයේ පැවති සියයට 10.5හි සිට 2023 අගෝස්තු මාසයේ දී සියයට 8.7 දක්වා තවදුරටත් පහළ ගියේය. ආහාර කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට -0.41ක මිල පහළ යෑමේ සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල වාර්තා වූ සියයට 0.39ක මිල ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2023 අගෝස්තු මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස සියයට -0.02ක් ලෙස වාර්තා විය. තවද, ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 ජූලි මාසයේ පැවති සියයට 5.9හි* සිට 2023 අගෝස්තු මාසයේ දී සියයට 4.6 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




මෙතෙක් ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂාවල ප්‍රතිඵලයක් ලෙස, උද්ධමනය මැදි කාලීනව මැදි තනි අගයක මට්ටමේ ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ වේ. විශේෂයෙන්ම, කෘෂිකාර්මික නිෂ්පාදනයට අයහපත් කාලගුණයෙන් සිදුවන බලපෑම සහ එමඟින් ආහාර උද්ධමනයේ ඇති විය හැකි ඉහළ යෑම, ගෝලීය ඉන්ධන හා වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑමට අනුකූලව දේශීය මිල ගණන් ඉහළ යෑමේ හැකියාව, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් කිසියම් අපගමනය වීමක් සිදුවීම, ආනයන සීමා ලිහිල් කිරීම මධ්‍යයේ විනිමය අනුපාතිකය මත සිදුවිය හැකි කිසියම් අවප්‍රමාණය වීමේ පීඩන සහ වැටුප් උද්ධමනය ඉහළ යෑමට ඇති හැකියාව වැනි පුරෝකථන ඉහළ යෑමේ අවදානම් ඇති විය හැකිය. මේ අතර, පුරෝකථන සඳහා පහළ යෑමේ අවදානම් සැලකුවිට, සැපයුම් තත්ත්ව තවදුරටත් සාමාන්‍යකරණය වීම මගින් මෙහෙයවනු ලබන ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත්වීමට ඇති හැකියාව සහ මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය අඩු වීමේ තිරසාර බලපෑම ඇතුළත් වේ.

***මූලය**: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2023 වසරේ ජූලි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වසරේ දෙවන කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ දත්ත නිකුත් කිරීමත් සමඟම උද්ධමන ව්‍යාප්ති සටහන සහ මෙම මැදි කාලීන පුරෝකථන 2023 ඔක්තෝබර් මාසයේදී පැවැත්වීමට නියමිත මීළඟ මුදල් ප්‍රතිපත්ති වාරයේදී යාවත්කාලීන කෙරෙනු ඇත.

(ආ) 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ඇත.

**උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |
| | අප්‍රේල් | 192.3 | 171.5 | -1.4 | -0.2 | 35.3 | 27.8 |
| | මැයි | 192.3 | 171.0 | 0.0 | -0.3 | 25.2 | 20.3 |
| | ජූනි | 192.3 | 169.9 | 0.0 | -0.6 | 12.0 | 9.8 |
| | ජූලි | 190.2 | 170.4* | -1.1 | 0.3* | 6.3 | 5.9* |
| | අගෝස්තු | 190.1 | 171.2 | -0.1 | 0.5 | 4.0 | 4.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ඇත.